# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

# 2018 සැප්තැම්බර් මස 04 වන දින පෙ.ව. 9.30 ට

## න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන
II. නොපැමිණසිටීමේ අවසරය පිළිබඳ යෝජනා
III. ලිපිලේඛන පිළිගැන්වීම
IV. කාරක සභා වාර්තා පිළිගැන්වීම.
V. පෙත්සම්
VI. ප්‍රශ්න / අතුරු ප්‍රශ්න

1. ගරු සුනිල් වටගල මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග ප්‍රවාහන සමුපකාර සංවර්ධන හා වෙළඳ නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2018.08.21 දින අසන ලද ප්‍රශ්නය; (ප්‍ර/ VI (1) / 18 /45)

අ. I සී/ස නැගෙනහිර හේවාගම් කෝරළයේ (හංවැල්ල) විවිධ සේවා සමුපකාර සමිතියේ අරමුදල් රු. කෝටි 59 ක් පුද්ගලික මූල්‍ය ආයතනයක ආයෝජනය කර ඇති බව ඔබතුමා දන්නේද? නොඑසේ නම් ඒ මන්ද?

II උක්ත මුදල් සඳහා පොලිය මෙන්ම මූලික මුදල ආපසු ලබා ගැනීමේ ගැටළුවක් පැන නැගී ඇත්ද?

III මෙම මුදල් ආයෝජනය සඳහා සමුපකාර සංවර්ධන රෙජිස්ට්‍රාර්වරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය ගෙන තිබේද?

IV එසේ ලිඛිත අනුමැතියක් ගෙන නොමැත්තේ නම් ඒ සම්බන්ධව ඔබතුමා ගන්නා පියවර කවරේද?

ආ. I මෙම විවිධ සේවා සමුපකාර සමිතියේ (හංවැල්ල) හි අරමුදල් 2012.05.14 දින සිට යොදවනු ලැබ ඇති ආකාරය පිළිබඳව නිසි සොයා බැලීමක් සිදු කර තිබේද?

II මෙම අරමුදල් ආයෝජනය කිරීම සම්බන්ධව වාර්ෂික විගණනයේ දී කරුණු අනාවරණය කරගෙන තිබේද?

III එසේම මූල්‍ය නියාමන මාසික ප්‍රගති සමාලෝචන කමිටුවේ දී හෝ F 28 මාසික මෙහෙයුම් වාර්තා සමාලෝචන කමිටුවේ දී මේ පිළිබඳව කරුණු අනාවරණය කරගෙන තිබේද?

2. ගරු සුනිල් වටගල මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග ප්‍රවාහන සමුපකාර සංවර්ධන හා වෙළඳ නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් **2018.08.21** දින අසන ලද ප්‍රශ්නය; (ප්‍ර/ VI (1) / 18 /46)

අ. බස්නාහිර පළාත් සමුපකාර ප්‍රඥප්තියේ 41 වගන්තියට පටහැනිව සී/ස නැගෙනහිර හේවාගම් කෝරළයේ විවිධ සේවා සමුපකාර සමිතියේ නිලධාරීන් කටයුතු කර ඇති බව ඔබතුමා පිළිගන්නේද?

ආ. එසේ නම් ඔවුන් සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි පියවර මොනවාද?

ඇ. උක්ත සමිතියේ ප්‍රාදේශික කාරක සභා නිලවරණය අවසාන වරට පවත්වා ඇත්තේ කවදාද?

ඈ. ඒ අනුව නිලවරණය පැවැත්වීම, වසර ගණනාවකින් ප්‍රමාද කර ඇති බව ඔබතුමා පිළිගන්නේද?

ඉ. එසේ ප්‍රමාද කර තිබියදී සමුපකාර සමිති ප්‍රඥප්තියේ 60 වගන්තිය යටතේ කටයුතු කර නොමැති බව ඔබතුමා පිළිගන්නේද?

• සභාව කල්තබන අවස්ථාවේ අසන ලද ප්‍රශ්න.

3. ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් **2018.08.21** වන දින සභාව කල් තබන අවස්ථාවේ දී අසන ලද ප්‍රශ්නය; (ප්‍ර/ VI (1) / 18 /ADG-04)

අ. පළාත් සභා නව ගොඩනැගිල්ලේ සභා ශාලාවේ වීඩියෝ පටිගත කිරීම් හා විකාශන පහසුකම්, නව තාක්ෂණ ඡන්ද සලකුණු කිරීම් හා ශබ්ද විකාශන පද්ධතිය සවි කිරීම ඇතුළු කටයුතු වෙනුවෙන් ටෙන්ඩර් කැඳවනු ලැබුවේද?

ආ. උක්ත ටෙන්ඩරයට අනුව ඉටු කළ යුතු කාර්යයන් මොනවාද?

ඇ. ටෙන්ඩර් මණ්ඩලය නියෝජනය කළ අය කවුරුන්ද?

ඈ. ඉදිරිපත් වූ ආයතන හා මිල ගණන් කවරේද?

ඉ. තෝරා ගනු ලැබුවේ කුමන ආයතනය ද?

ඊ. තෝරා ගන්නා ලද ආයතනය ඉදිරිපත් කළ ලංසුවලින් කුමන ස්ථානය ද?

උ. එම ආයතනය තෝරා ගැනීමට හේතු කවරේද?

ඌ. උක්ත ආයතන ඉදිරිපත් කළ සුදුසුකම් විස්තර හා මිල ගණන් පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් සභාගත කරන්නේද? නොඑසේ නම් ඒ මන්ද?

4. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු; ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට; (ප්‍ර/ VI (1) / 18 /49)

අ. පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව හදාරන ගුරුවරුන්ට ඒ සඳහා වන පාඨමාලා ගාස්තු වලින් අඩක් ගෙවීමට පළාත් සභාව මීට පෙර ගෙන තිබූ ක්‍රියාමාර්ගය නවතා තිබේද යන්න ඔබතුමා සභාවට දන්වන්නෙහිද?

ආ. එසේ නොමැතිනම් සමහර අධ්‍යාපන කලාප වල ගුරුවරුන් සඳහා එම දීමනාව නොගෙවන බව ඔබතුමා පිළිගන්නෙහිද?

ඇ. විශේෂයෙන් පිළියන්දල අධ්‍යාපන කලාපයේ මෙම ගෙවීම 2006 වසරේ සිට නවතා තිබෙන්නේ කුමන පදනමක් මතද යන්න ඔබතුමා දන්වන්නෙහිද?

ඈ. කාර්යක්ෂම සේවයක් උදෙසා ගෙවනු ලබන මෙම මුදල් ලබා දීම සඳහා ඔබතුමා ගනු ලබන ක්‍රියාමාර්ගය කුමක්ද යන්න සභාවට දන්වන්නෙහිද?

ඉ. නොඑසේනම් ඒ මන්ද?

5. ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටුයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට; (ප්‍ර/ VI (1) / 18 /50)

අ. ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක, සභානායක, විපක්ෂ නායක, විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ධුරයන් ලෙස මන්ත්‍රීවරයකුට අමතරව ලබා දී ඇති ඒ ඒ ධුරයන්ට අනුව වරප්‍රසාදයන් හා පහසුකම් මොනවාද?

ආ. එම ධුරයන්හි වරප්‍රසාදයන් හා පහසුකම් වෙනුවෙන් මාසිකව වැය කරන්නා වූ මුදල ධුරයන්ට අදාලව වෙන වෙනම සඳහන් කරන්නේද?

ඇ. එම ධුරයන්ට පැවරී ඇති කාර්යභාරයන් කවරේද?

6. ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට, (ප්‍ර/ VI (1) / 18 /51)

අ. බස්නාහිර පළාත් සභා නව ගොඩනැගිල්ල ඉදි කිරීම, සියළු පහසුකම් සහිතව සම්පූර්ණ කිරීමට සකස් කළ ඇස්තමේන්තු වල මුළු වටිනාකම කීයද?

ආ. එකී ඇස්තමේන්තු වලට අනුව වැඩ අවසන් වී නැති කටයුතු මොනවාද?

ඇ. වැඩ අවසන් කළ සියළු කටයුතු වෙනුවෙන් වැය කළ මුළු මුදල කීයද?

ඈ. ඒ පිළිබඳව සම්පූර්ණ වාර්තාවක් සභාවට ඉදිරිපත් කරන්නේද?

7. ගරු රජිත හපුආරච්චිගේ මන්ත්‍රීතුමා විසින් ගරු කෘෂි කර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට;
(ප්‍ර/ VI (1) / 18 /52)

අ. i. තිරසාර ගොවිපලවල් සංවර්ධනය කිරීම යටතේ ගොවිපලවල් 600 ක් සංවර්ධනය කිරීම් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වන්නේද?

ii. එම ගොවිපල 600 සංවර්ධනය කිරීම සඳහා සත්ව සංවර්ධන උපදේශකවරුන්ට වගකීම පවරා තිබේද?

iii. එම වගකීම ඉටුකිරීමට සත්ව සංවර්ධන උපදේශකවරුන් ප්‍රතික්ෂේප කර තිබේද? එසේ නම් ඒ ඇයි?

ආ. i. උක්ත ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීම සත්ව සංවර්ධන උපදේශකවරුන්ගේ වෘත්තිමය ක්‍රියාමාර්ගයක් නිසා ප්‍රමාද වන්නේද?

ii. එම වෘත්තිමය ගැටළු සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරතුමා විසින් ලබා දුන් තීරණයන් ගැන ඔබතුමා දැනුවත් වී සිටියද? එම තීන්දු මොනවාද?

iii. එම තීරණ ක්‍රියාත්මක කිරීම තවදුරටත් ප්‍රමාද වී තිබෙන්නේ කුමන කරුණු නිසාද?

iv. ගරු ආණ්ඩුකාරතුමාගේ තීන්දු හා නියමයන් ක්‍රියාත්මක කිරීම සඳහා ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ග කවරේද?

8. ගරු රජිත හපුආරච්චිගේ මන්ත්‍රීතුමා විසින් ගරු කෘෂි කර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට;
(ප්‍ර/ VI (1) / 18 /53)

අ. i. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර අනුව මහජන සෞඛ්‍ය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමට වගකීමක් තිබේද?

ii. පිස්සු බලු රෝග මර්ධනය හා වන්ධ්‍යාකරණ සැත්කම් සිදු කිරීමේ කාර්යභාරය සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට පවරාගෙන ඇති බව ඔබතුමා දන්නේද?

iii. එසේ පවරාගෙන ඇත්නම් ඒ කුමන පදනමක් මත කුමන හේතු නිසාද?

ආ. i. පිස්සු බලු රෝග මර්ධනය වන්ධ්‍යාකරණය මෙතෙක් නොමිලයේ සපයා දුන් සේවයක් බව පිළිගන්නේද?

ii. වර්තමානයේ ඒ සඳහා සත්ව සංවර්ධන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මඟින් මුදලක් අය කරන්නේද?

iii. එසේ අයකරන්නේ නම් ඒ කුමන පදනමක් මතද?

iv. එලෙස අයකරන මුදල් පළාත් සභාව අය කර ගැනීමෙන් අනතුරුව නැවත අදාල නිළධාරීන්ටම ප්‍රතිපූර්ණය වන බව ඔබතුමා දන්නේද?

v. මෙමගින් වක්‍රාකාරව සිදුවන්නේ රාජ්‍ය දේපල හා සේවා කාලය භාවිතා කරමින් ඇතැම් කණ්ඩායමක් මහජනතාවගේ මුදල් උපයා ගැනීමක් බව ඔබතුමා පිළිගන්නේද?

ඇ. මෙම සේවාව නැවත මහජන සෞඛ්‍ය සේවාව යටතට පත් කොට නොමිලයේ එම සේවාව ජනතාවට ලබා දීමට ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ග මොනවාද?

VII. පෞද්ගලික ප්‍රකාශ

VIII. වරප්‍රසාද කඩවීම් පිළිබඳ ප්‍රකාශ

IX. අමාත්‍යාංශ නිවේදන / අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ / වරප්‍රසාද කඩවීම් පිළිබඳ පිළිතුරු

X. පොදු කටයුතු

01. ගරු කෘෂි කර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමා (බ.ප.) විසින් පිළිගන්වනු ලබන

**ප්‍රඥප්තිය:**

"2018 අංක ------- දරණ බස්නාහිර පළාතේ ධීවර සහ ජලජ සම්පත් ප්‍රඥප්තිය"

(පළමුවර කියැවීම)

[ බස්නාහිර පළාතේ සමුද්‍ර ජල තීරයේ මෙන්ම අභ්‍යන්තර ජලාශවල ධීවර කර්මාන්තය විධිමත්ව කළමනාකරණය කිරීම සඳහා ද, බස්නාහිර පළාතේ ධීවර ප්‍රජාවගේ සුභ සාධනය සඳහා කටයුතු කිරීම සඳහා ද, බස්නාහිර පළාතේ පාරිභෝගික ජනතාව වෙත සාධාරණ මිලකට මාළු හා මාළු ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරීම සඳහා ද,

එකී කාර්යයන් සාර්ථකව ඉටුකිරීමට පළාත් ධීවර අධ්‍යක්ෂක ධුරයක් ස්ථාපනය සඳහා ද, පළාත තුළ ධීවර කටයුතු පවත්වාගෙන යාම සඳහා උපදේශක සභාවක් පත්කිරීම සඳහා සහ ඒ සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම සඳහා වූ ප්‍රඥප්තියකි. ]

02. ගරු කෘෂි කර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමා (බ.ප.) විසින් පිළිගන්වනු ලබන

**ප්‍රඥප්තිය:**

"බස්නාහිර පළාතේ 2018 අංක --------- දරණ බස්නාහිර පළාත් කෘෂි සේවා අධිකාරි සංශෝධන ප්‍රඥප්තිය"

(පළමුවර කියැවීම)

[ 2012 අංක 01 දරණ බස්නාහිර පළාත් කෘෂිසේවා අධිකාරි ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි. ]

## XI. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

### 01. ගරු ගුණසිරි ජයනාත් මන්ත්‍රීතුමා:

"වර්තමාන ගරු අග්‍රමාත්‍යතුමන් විසින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති හානිපූරණය සඳහා වන කාර්යාලය පිහිටුවීම පිණිස වූ පනත් කෙටුම්පත මඟින් උතුරු සහ නැගෙනහිර පළාත්වල සිදු වූ සන්නද්ධ ගැටුම් අතරතුර එහි ප්‍රතිඵලයක් වශයෙන් හෝ, ඊට සම්බන්ධ හෝ එහි පසුවිපාකයක් ලෙස, පීඩාවට පත් තැනැත්තෙකු සඳහා යම් මූල්‍යමය ගෙවීමක් හෝ ද්‍රව්‍යමය ප්‍රතිලාභ දීම, ස්මාරක සෑදීම හා මියගිය තැනැත්තෙකුගේ අනුස්මරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා නෛතික ප්‍රතිපාදන සලසන තත්වයක් තුල මුළුමනින්ම කුරිරු ත්‍රස්තවාදීන්ට වන්දි ගෙවීමේ පසුබිමක් සැකසෙන බැවින් ඒ පිළිබඳව බලවත් අප්‍රසාදය රජයට පළකරන අතරම, ඊට පනත් කෙටුම්පතේ අදාල වගන්ති වන 27 (ආ) (I), (අ) ඉවත් කර ඒ වෙනුවට බ්ලුමැන්ඩල්, මීතොටමුල්ල ,කුණුකඳු කඩා වැටීමෙන්ද, සාලාව අවි ගබඩාව පුපුරා යාමෙන්ද, ගංවතුර ගැලීම් ආදි ව්‍යසනයන්ට ලක්වූ ජනතාවට හා දේපළ වලට වන්දි ගෙවීමට හැකිවන ආකාරයේ නෛතික ප්‍රතිපාදන මෙම පනත් කෙටුම්පතට ඇතුලත් කරන මෙන් මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව, රජයෙන් ඉල්ලා සිටියි."

(යෝ/ 8110/VI (1) / 18 /03)

[2018.08.21 දින පැවති සභා /රැස්වීමේ වැඩ කටයුතු හා සම්බන්ධිතයි.]

### 02. ගරු සුනිල් වටගල මන්ත්‍රීතුමා:

"බ්ලුමැන්ඩල් කුණු කන්ද, මීතොටමුල්ල කුණු කන්ද, කරදියාන කුණු කන්ද, වැනි කුණු කඳු කඩා වැටී මනුෂ්‍ය ජීවිතත්, සමස්ත පරිසරයත් ව්‍යසනයට පත් වෙද්දී ඒවාට වග කියන බලධාරීන්, ආයතන ,ඒවා වැළැක්වීමටත් ,ඒවාට ස්ථිර සාර විසඳුම් යොදන බවත්, කියමින් නොයෙකුත් පුරසාරම් දොඩන ලදී. මීතොටමුල්ල කුණු කන්දත්; බ්ලුමැන්ඩල් කුණු කන්දත්, නාගරික උද්‍යාන බවට පත් කරන බවට ප්‍රකාශ කරන ලදී. තවමත් එම කුණු කඳු එසේම පවතී. දීර්ඝ කාලීන වැඩපිළිවෙලක් නොමැත. කැළණි ගඟ වසරක් පාසා පිටාර ගලද්දී ඒවාට යට වන ජනතාවට එම අවස්ථාවේ දී බත් පැකට්ටුවක්, වියළි ආහාර ටිකක් බෙදා දී තාවකාලිකව සමනය කරනු ඇත. මෙම සියළු ව්‍යසනයන්ට ඒ ඒ විෂයන් අයත් අමාත්‍යාංශ මැදිහත්ව ,දීර්ඝකාලීන විසඳුම් ඉදිරිපත් කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව යෝජනා කර සිටියි."

(යෝ/ VI (1) / 18/04)

03. ගරු උපාලි කොඩිකාර මන්ත්‍රීතුමා :

"බස්නාහිර පළාතේ අධ්‍යාපන කලාප මට්ටමින් පිහිටුවනු ලැබ ඇති විශේෂ අවශ්‍යතා ඇති දරුවන් ඉගෙනුම ලබන පාසල් සංඛ්‍යාව 182 ක් පමණ වන අතර, එම පාසල් වල ඉගෙනුම ලබන විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සංඛ්‍යාව 3713 කි.

රජයේ පාසල් වල ඉගෙනුම ලබන සාමාන්‍ය දරුවන්හට 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රතිඵල මත ශිෂ්‍ය ආධාර මුදලක්ද, විශ්ව විද්‍යාල සිසුන්හට මහපොළ ශිෂ්‍යත්වය මගින් ශිෂ්‍ය ආධාර මුදලක්ද, ලබා දීමේ ක්‍රමයක් පැවතිය ද විශේෂ අවශ්‍යතා සහිත දරුවන්හට ශිෂ්‍ය ආධාර මුදලක් ලබා දීමේ ක්‍රමවේදයක් නොමැත.

බස්නාහිර පළාතේ විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා අධ්‍යාපනය ලබා දෙන පාසල් වල ඉගෙනුම ලබන දරුවන් දිරි ගැන්වීම සඳහා එම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් යම් දීමනාවක් ආධාර මුදලක් ලබා දිය යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කර සිටියි."

(යෝ/ VI (1) / 18/05)

## XII. සභාව කල් තැබීම.

2018.08.21 දින
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

කේ.එච්.ඩී.කේ. සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.